# ටැබී සහ ලැබී



ඔකිත්මා විජේසිංහ

# ටැබී සහ ලැබී

## ඔකිත්මා විජේසිංහ

කතා

පළමු දිගහැරීම

මහ/මහාමායා බාලිකා විද්‍යාලය
2 වසර - E
2026.03.12
ISBN 978-624-211-329-6

# පිදුම

ආදරණීය දිල්රුක්ෂි ගුරුතුමියට
ආදරණීය අම්මා අප්පච්චි ට
සහ
ආදරණීය අත්තම්මා අත්තාට....!



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

එකෝමත් එක කාලෙක ටැබී කියලා පූස් අම්මෙක් සහ ලැබී කියලා පූස් පැටියෙක් හිටියා. මේ දෙන්න හරිම ආදරෙන් හිටියා.



ටැබී සහ ලැබී හිටියේ ලස්සන පොඩි ගෙදරක. මේ දෙන්නා නිතරම සෙල්ලම් කරා. එහේ මෙහේ දුව පැන ඇවිද්දා.



මෙයාලාව බලා ගත්තේ පුංචි ගැහැණු ළමයෙක්. මෙයා ටැබීටයි ලැබීටයි හරිම ආදරෙන් සැලකුවා. හැමදාම කන්න  බොන්න දුන්නා. මේ විදිහට හැමෝම සතුටින් සිටියා.



ඉතින් දවසක් මේ තුන්දෙනා සෙල්ලම් කර කර ඉන්නකොට ගැහැණු ළමයාගේ අම්මාගේ යාළුවෙක් ආවා. ඉතින් අම්මා පූස් පැටියව ඒ කියන්නේ ලැබීව අම්මාගේ යාළුවට තෑග්ගක් විදිහට දුන්නා.




මේකට ටැබීටයි පුංචි ගැහැණු ළමයාටයි හරිම දුකයි. තෑග්ගක් විදිහට දුන්න නිසා ආයෙත් ඉල්ලන්න බෑ කියලා අම්මා කීවා.



ඉතින් ටැබී සහ ගැහැණු ළමයා ලැබී ආයෙත් එනකල් ගොඩක් දවස් බලා ගෙන හිටියා. ඒත් එයා ආවේ නෑ. මේ විදිහට කාලය ගත වුනා. ලැබී කවදාවත් ආවේ නෑ. ඉතින් ටැබී සහ ගැහැණු ළමයා ලැබී ගැන තිබුණු බලාපොරොත්තු අත් හැර ගත්තා.



මේ අතර ලැබී හිටියෙත් හරිම දුකෙන්. එයාට කෑම කන්නවත් හිතුන් නෑ. හැම වෙලේම අම්මා එක්ක සතුටින් සෙල්ලම් කරපු හැටි මතක් වුනා.



ලැබී ටිකෙන් ටික ලොකු වුනා. එයා හිතුවා අම්මා බලන්න යන්න ඕන කියල. ඉතින් ලැබී ඉන්න ගෙදරින් පැනල යන හැටි කල්පනා කරා. දවසක් ලැබී ඉන්න ගෙදර කට්ටිය ගමනක් ගියා. එයාලට අමතක වෙලා ගෙදර ජනේලයක් ඇරලා ගිහින් තිබුනා. ඉතින් ලැබී මේ ජනේලෙන් පැනල අම්මා බලන්න යන්න ඕන කියලා හිතුවා.



ලැබීට බයත් හිතුනා. ඒත් හිතට හයිය ගත්තා. ලැබී ජනේලයෙන් එලියට පැන ගත්තා. කලින් හිටපු ගෙදර කොහොමහරි හොයා ගෙන යන්න පිටත් වුනා.



මෙහෙම ඉන්නකොට දවසක් ලැබී වගේම පූසෙක් ටැබීවයි ගැහැණු ළමයවයි හොයා ගෙන ආවා. ටැබීටයි ගැහැණු ළමයටයි හරිම පුදුමයි. අනේ ඒ ලැබීම තමයි. ලැබී ඉස්සරට වඩා ලොකු වෙලා. ගෙදර හැමෝටම සතුටුයි.



ගැහැණු ළමයා ටැබීටයි ලැබීටයි ලස්සන සෙල්ලම් ගෙයක් හදලා දුන්න. ඉතින් මේ දෙන්න එකට වෙලා නිතරම සෙල්ලම් කරා. මේ විදිහට ලැබී එයාගේ අම්මා ටැබී එක්ක සතුටින් හිටියා.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN: 978-624-211-329-6